THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

NOT FOR SALE

05204 - මූලික කළමනාකරණ ගණකාධිකරණය සහ ව්‍යාපාර මූල්‍ය ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - II

2013 මාර්තු

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

හිමිකම් ඇවිරිණි.

"A" කොටස

ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න

<u>පිළිතුරු අංක 01</u>

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
ඒකකයක විකුණුම් මිල (රු.)	300	420
සෘජු ද්‍රව්‍ය පිරිවැය (රු.)	50	60
සෘජු ශ්‍රම පිරිවැය (රු.)	40	80
සෘජු වියදම් - විචල්‍ය (රු.)	56	50
ඒකකයක දායකය	154	230

(අ) (i) විකුණුම් ඒකක ගණන සීමාකාරී නම් නිෂ්පාදන ප්‍රමුඛතාවය ඒකක දායකය අනුව විය යුතුය.

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
ඒකකයක දායකය	154	230
ප්‍රමුඛතාවය	2	1
නිෂ්පාදන කලයුතු ඒකක ගණන	4000	6000

(ii) සමස්ථ අලෙවි හැකියාව වටිනාකම අනුව සීමාවන්නේ නම් එය C/S අනුපාතය අනුව ප්‍රමුඛතාවය දියයුතුය.

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
C/S අනුපාතය	51.3%	54.8%
ප්‍රමුඛතාවය	2	1
භාණ්ඩ මිශ්‍රණය	3000	6000
විකුණුම් වටිනාකම (රු.000)	900	2520

(iii) X නැමති අමුද්‍රව්‍යයේ සැපයුම හිඟනම් ප්‍රමුඛතාවය X අමුද්‍රව්‍ය කි.ග්‍රෑම් 1 ට දායකය අනුව විය යුතුය.

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
X අමුද්‍රව්‍ය භාවිතය	2	3
X අමුද්‍රව්‍ය කි.ග්‍රෑම් 1 ට දායකය	77.00	76.67
ප්‍රමුඛතාවය	1	2
භාණ්ඩ මිශ්‍රණය	6000	4000
X අමුද්‍රව්‍ය භාවිතය	12,000	12,000

NOT FOR SALE

(iv) නිෂ්පාදන ධාරිතාව යන්ත්‍ර පැය අනුව සීමාවන්නේ නම් එක යන්ත්‍ර පැයකට දායකය අනුව වියයුතුය.

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
අවශ්‍ය යන්ත්‍ර පැය	3	4
එක යන්ත්‍ර පැයකට දායකය	51.33	57.50
ප්‍රමුඛතාවය	2	1
භාණ්ඩ මිශ්‍රණය	2000	6000
යන්ත්‍ර පැය භාවිතය	6000	24000

(ලකුණු 08)

(ආ)

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
ශ්‍රම භාවිතය	1	2
එක ශ්‍රම පැයකට දායකය	154	115
ප්‍රමුඛතාවය	1	2

සෘජු ද්‍රව්‍ය හා ශ්‍රමය අනුව ප්‍රමුඛතාවයන් එක සමානය. එබැවින් 'A' භාණ්ඩය 1 ප්‍රමුඛතාවයද, 'B' භාණ්ඩය 2 ප්‍රමුඛතාවය ගනු ඇත.

ශ්‍රම භාවිතය පමණක් සැලකුවිට,

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
භාණ්ඩ මිශ්‍රණය	6000	5000
ශ්‍රම පැය භාවිතය	6000	10000

අමුද්‍රව්‍ය X පමණක් සැලකුවිට,

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
භාණ්ඩ මිශ්‍රණය	6000	4000

සීමාකාරී සාධක දෙකම සැලකුවිට 'B' භාණ්ඩය ඉහත සඳහන් අවස්ථා දෙකෙහි අඩු අගය ගනී.

එබැවින් ලාභය = 6,000 x 154+4,000 x 230- 420,000 = රු. 1,424,000 (ලකුණු 03)

(සටහන : ශ්‍රම පැය 16,000 න් 14,000 ක පමණක් ප්‍රමාණවත් වේ.)

(ඇ)

	'A' භාණ්ඩය	'B' භාණ්ඩය
සෘජු ශ්‍රම ප්‍රමුඛතාවය	1	2
යන්ත්‍ර පැය ප්‍රමුඛතාවය	2	1

මෙම ප්‍රමුඛතාවයන් එකිනෙකට පටහැනි බැවින් රේඛීය ප්‍රකමණ ක්‍රමවේදය යොදාගතයුතුය.

NOT FOR SALE

A සහ B හි ඒකක ගණන a සහ b නම්

අරමුණ ශ්‍රීතය	:	154a + 230b උපරම කිරම		
ශ්‍රම සීමාකරණය	:	$a + 2b \leq 16000$	a = 0 b = ?	b = 0 a = ?
යන්ත්‍ර පැය සීමාකරණය	:	$3a + 4b \leq 30000$	8,000	16,000
ඉල්ලුම	:	$0 \leq a \leq 6000$	7,500	10,000
		$0 \leq b \leq 6000$		



ප්‍රශස්ත ලක්ෂ්‍ය ඇගයීම	P	Q	R	S
A ඒකක ගණන	0	2000	6000	6000
B ඒකක ගණන	6000	6000	3000	0
මුළු සහභාගය ප්‍රශස්ත ලක්ෂය Q (රු'000)	1380	1688	1614	924

ප්‍රශස්ත භාණ්ඩ මිශ්‍රණය : A - 2000 , B - 6000

මෙම ලක්ෂ්‍යයේදී ලාභය: 2000 x 154 + 6000 x 230 - 420,000 = රු. 1,268,000

සටහන : ශ්‍රම භාවිතය : 2000 x 1 + 6000 x 2 = 14000 පමණකි. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

<u>පිළිතුරු අංක 02</u>

(අ) 2013 පෙබරවාරි මාසයේ දී නිෂ්පාදිත ඒකක ගණන

නිමිභාණ්ඩ තොග ගැලපීම මගින්

තොග ගැලපීම (රු.)	2,565,000.00
ඒකක පිරිවැය (W1)	513.00
තොග ගැලපුම් ඒකක	**5,000.00**

මෙය නිෂ්පාදන පිරිවැයින් අඩු කිරීමක් බැවින් නිෂ්පාදිත ඒකක ගණන විකුණුම් ඒකක ගණනට වඩා වැඩිය.

එබැවින් නිෂ්පාදිත ඒකක ගණන (105,000 + 5,000) = **110,000**

<u>W1 - ඒකක ප්‍රමිත පිරිවැය</u>

		රු.
අමුද්‍රව්‍ය	363.60 / 1.2	303.00
ශ්‍රමය	48 / 1.2	40.00
විචල්‍ය පොදුකාර්ය	60 / 1.2	50.00
ස්ථාවර පොදුකාර්ය	144 / 1.2	120.00
එකතුව		**513.00**

<u>විකල්ප පිළිතුර</u>

අවශෝෂනය කල ස්ථාවර නිෂ්පාදනය පොදුකාර්ය	13.20
ඒකකයක ස්.පො.පි. (144,000,000/1,200,000)	120.00
එබැවින් නිෂ්පාදිත ඒකක	**110,000.00**

(ආ) සත්‍ය ගැනුම් x සත්‍ය මිල = 34,782,000

දව්‍ය මිල විචලනය = 1,122,000 අවාසි

සත්‍ය ගැනුම් x ප්‍රමිති මිල = 33,660,000

ප්‍රමිත භාවිතය x ප්‍රමිත මිල = 33,330,000

(303 x 110,000)

(i) සෘජු ද්‍රව්‍ය භාවිත විචලතාව = (ප්‍රමිත භාවිතය - සත්‍ය භාවිතය) ප්‍රමිත මිල

= 33,330,000 - 33,660,000 = (330,000) (අවාසි)

(ii) ශ්‍රම අනුපාත විචලතාව = (ප්‍රමිත අනුපාතය - සත්‍ය අනුපාතය) සත්‍ය පැය

= (240 - 240) ∗22,000 = 0

(iii) ශ්‍රම කාර්යක්ෂම විචලතාව = (ශ්‍රමික පැය - සත්‍ය පැය) ප්‍රමිත අනුපාතය

= (110,000 ∗ 200,000/1,200,000-22,000) ∗240 = (880,000) (අවාසි)

(iv) විචල්‍ය පොදුකාර්ය වියදම් විචලතාව = (ප්‍රමිත පොදුකාර්ය සත්‍ය පැය සඳහා - සත්‍ය වි.පො.)

= (22,000 ∗ (60mn/200,000hrs) - 6,820,000)
= (220,000) අවාසි

NOT FOR SALE

(v) විචලා පොදුකාර්ය කාර්යක්ෂමතා විචලතාව = (ප්‍රමිත පැය සත්‍ය නිෂ්පාදනයට - සත්‍ය පැය) ප්‍රමිත අනුපාතය

= (110,000 * (200,000/1.2mn) - 22,000) * 300 = **(1,100,000)** අවාසි

(vi) ස්ථාවර පොදුකාර්ය වියදම් විචලතාව = (අයවැයගත පොදුකාර්ය - සත්‍ය පොදුකාර්ය)

සත්‍ය පොදුකාර්ය = (13.2mn -1.3 mn) = **11,900,000**

(12,000,000 -11,900,000) = **100,000** වාසි

(vii) ස්ථාවර පොදුකාර්ය පරිමා විචලා = ප්‍රමිත සථාවර පො.පි.ඒකකයට (සත්‍ය නිෂ්පාදනය- අයවැයගත නිෂ්පාදනය)

= 120 (**110,000** - 100,000) = **1,200,000** (වාසි)

(viii) විකුණුම් මිල ආන්තික විචලතාව = සත්‍ය විකුණුම් (සත්‍ය මිල - ප්‍රමිත මිල)

= 105,000 (740 - 730) = **1,050,000** වාසි)

(x) විකුණුම් ආන්තික පරිමා විචලතාව = ප්‍රමිත ආන්තිකය (සත්‍ය විකුණුම්- අයවැයගත විකුණුම්)

= (730-513) (105,000 - 100,00) = **1,085,000** (වාසි)

(ලකුණු 12)

(ඇ)
* සේවකයන් අභිප්‍රේරණය කිරීම සඳහා යොදා ගැනීම.
* අකාර්යක්ෂම අංශ සොයාගැනීමට හා ඒවා නිවැරදි කිරීමට උපයෝගි කරගනු සඳහා.
* ආයතනයේ ක්‍රියාකාරිත්වය ඇගයීමට උපයෝගි කරගත හැක.
* සේවකයින්ගේ ක්‍රියාකාරිත්වය ඇගයීම සහ විචලනයන් හඳුනාගෙන එමගින් සේවක දිරිදීමනා ප්‍රදානය කිරීමට උපයෝගි කරගත හැක.
* අවශ්‍යතා පුරෝකථනය කිරීම මගින් සැලසුම් කිරීමට සහාය වීම.
* මිල තීරණ ගැනීමට උපයෝගි කරගත හැක.

(ලකුණු 03)

(ඈ)
* යන්ත්‍ර නිසිලෙස නඩත්තු කිරීම මගින් ශ්‍රම නාස්තිය අවම කරගත හැක.
* විධිමත් ශ්‍රම විභජනය සහ නිෂ්පාදන පෙලගැස්වීම.
* තත්වයෙන් අඩු අමුද්‍රව්‍ය යොදා නොගැනීම මගින් දෝෂ සහිත නිෂ්පාදන අවම කරගත හැක.
* අඛණ්ඩ අමුද්‍රව්‍ය සපයාගැනීම මගින් යන්ත්‍ර අපේක්ෂිත මට්ටමට භාවිතයට ගැනීම.
* වැඩ කිරීමට යහපත් පරිසරයක් ඇතිකිරීම.
* සේවයකයන්ට යන්ත්‍රෝපකරණ භාවිතය ගැන නිසි පුහුණුවක් දීම.
* සේවා අධීක්ෂණය.
* දිරිගැන්වීම් සහ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
* ඵලදා වර්ධනය සඳහා සේවක දිරිගැන්වීම් සහ අනෙකුත් අභිප්‍රේරණ ක්‍රියාමාර්ග.

(ලකුණු 03)

(මුළු ලකුණු 20)

NOT FOR SALE

පිළිතුරු අංක 03

(අ) (i) යලි ඇනවුම් මට්ටම = උපරිම භාවිතය + උපරිම ඇනවුම් කාලය
1600 x 5
8000

(ii) උපරිම තොග මට්ටම = [යලි ඇනවුම් මට්ටම + යලි ඇනවුම් ප්‍රමාණය] - [අවම භාවිතය x අවම ඇනවුම් කාලය]
= [8000 + 6000]-[1200 x 2]
= 11600

(iii) අවම තොග මට්ටම = යලි ඇනවුම් මට්ටම - [සාමාන්‍ය භාවිතය x සාමාන්‍ය ඇණවුම් කාලය]
= 8000 - [1400 x 4]
= 2400

(iv) සාමාන්‍ය තොග මට්ටම = (උපරිම තොග වට්ටම + අවම තොග වට්ටම) / 2
= (11600 + 2400) / 2
= 7000

(ලකුණු 03)

(ආ) (i)

දිනය	යොමුව	ලැබීම්			නිකුත්කිරීම්			ශේෂය		
		ඒකක	ඒකකයක මිල	වටිනාකම	ඒකක	ඒකකය ක මිල	වටිනාකම	ඒකක	ඒකකයක මිල	වටිනාකම
දෙසැ. 01	ශේෂය							10,000	10.00	100,000
දෙසැ. 07	GRN#	4,000	12.50	50,000				10,000	10.00	100,000
								4,000	12.50	50,000
දෙසැ. 14	GRN#	6,000	15.00	90,000				10,000	10.00	100,000
								4,000	12.50	50,000
								6,000	15.00	90,000
දෙසැ. 16	MRN#				10,000	10.00	100,000			
					4,000	12.50	50,000			
					2,000	15.00	30,000	4,000	15.00	60,000
දෙසැ. 24	GRN#	8,000	16.50	132,000				4,000	15.00	60,000
								8,000	16.50	132,000
දෙසැ. 28	MRN#				4,000	15.00	60,000			
					6,000	16.50	99,000	2,000	16.50	33,000

(ලකුණු 07)

NOT FOR SALE

(ii) දෙසැ. 16 හරිත සාමාන්‍ය තොග වටිනාකම = (100000 + 50000 + 90000) / 20000 = 12

දෙසැ. 16 නිකුත්කිරීම් පසු ශේෂය = 4000 x 12 = රු. 48000

දෙසැ. 28 හරිත සාමාන්‍ය තොග වටිනාකම = (48000 + 132000) /12000 = 15

දෙසැ. 28 නිකුත්කිරීම් පසු ශේෂය = 2000 x 15 = රු. 30000

(ලකුණු 02)

(iii) වාසි

(අ) තේරුම්ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට පහසු ක්‍රමයකි.

(ආ) නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ගෙවන ලද සත්‍ය පිරිවැය මත අය කරන බැවින් එය පිරිවැය මූලධර්මවලට එකඟය.

(ඇ) ද්‍රව්‍යයන්ගේ ගිණුම්කරන ප්‍රවාහය සහ භෞතික ප්‍රවාහය එකමය.

(ඈ) අවසාන තොගය වර්තමාන වෙළඳපොල වටිනාකමට ආසන්න අගයක් ගනී.

(ඉ) ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුව මෙය නිර්දේශිත ක්‍රමයකි.

අවාසි

(අ) මෙම ක්‍රමය සඳහා පරිගණක කිරීමක් හෝ වැඩි ශ්‍රම දායකත්වයක් අවශ්‍යවේ.මෙය වියදම් සහිතයි.

(ආ) අමුද්‍රව්‍ය විවිධ තොග වලින් ලබාගෙන ඇති නිසා එකම දිනයක් තුල කල සමාන වැඩ සඳහා වෙනස් පිරිවැයක් ගණනය විය හැක.

(ඇ) මිල උච්චාවචන තත්වයක් යටතේ පිරිවැය ප්‍රවර්තන වෙළඳපොල තත්වයන් නිරූපනය නොකරනු ඇත.

(ලකුණු 03)

(මුළු ලකුණු 15)

පිළිතුරු අංක 04

(අ) කොන්ත්‍රාත් ගිණුම

	A	B		A	B
ගබඩා	1,350.00	21,000.00	අමුද්‍රව්‍ය මාරුකිරීම් - A	-	200.00
අමුද්‍රව්‍ය මාරුකිරීම් B	200.00	-	ද්‍රව්‍ය ආපසු එවීම් ගබඩා	100.00	350.00
ශ්‍රම පිරිවැය	580.00	3,600.00	ද්‍රව්‍ය තොගය 2012-12-31	150.00	2,000.00
ගෙවිය යුතු ශ්‍රම පිරිවැය	60.00	800.00	ද්‍රව්‍ය නැතිවීම්	-	50.00
වෙනත් පොදුකාර්ය	250.00	1,300.00	සහතික නොකල වැඩ පිරිවැය ඉ/ගෙ	50.00	100.00
ක්ෂය කිරීම්	10.00	900.00	සහතික කල වැඩ පිරිවැය	2,150.00	24,900.00
	2,450.00	27,600.00		2,450.00	27,600.00
සහතික කල වැඩ පිරිවැය	2,150.00	24,900.00	ලාභාලාභ ගිණුම/පිරිවැය (W2)	2,300.00	24,480.00
ඉ/ගෙ ශේෂය	150.00	-	ඉ/ගෙ ශේෂය	-	420.00
	2,300.00	**24,900.00**		**2,300.00**	**24,900.00**

NOT FOR SALE

(W1) <u>කොන්ත්‍රාත් ලාභය ගණනය කිරීම.</u>

	A	B
කොන්ත්‍රාත් මිල	4,200.00	57,500.00
සහතික කළ වැඩ පිරිවැය	(2,150.00)	(24,900.00)
සහතික නොකළ පිරිවැය	(50.00)	(100.00)
තවදුරටත් දැරිය යුතු පිරිවැය	(2,200.00)	(26,000.00)
ලාභය/අලාභය	(200.00)	6,500.00

(W2) **විකුණුම් වටිනාකම අනුව, නිමවුම් ප්‍රතිශතය**

	A	B
සහතික කල වටිනාකම		27,600.00
කොන්ත්‍රාත් මිල		57,500.00
නිමවුම් ප්‍රතිශතය		48.00%
ලාභය/අලාභය 2012 දෙසැ. 31	(200)	3,120.00

A කොන්ත්‍රාත්තුව අලාභයක් ජනිත කරන බැවින් එය මුළුමනින්ම අදාල කාලය සඳහා ලාභ අලාභ ගිණුමට හර කළ යුතුය.

ලාභාලාභ ගිණුමට මාරු කළයුතු පිරිවැය = 27,600 - 3,120 = 24,480 → B කොන්ත්‍රාත්තුව

= 2,100 + 200 = 2,300 → A කොන්ත්‍රාත්තුව

<u>**විකල්ප පිළිතුර**</u>

පිරිවැය අනුව, නිමවුම් ප්‍රතිශතය

	A	B
පිරිවැය		25,000.00
අමතර පිරිවැය		26,000.00
මුළු පිරිවැය		51,000.00
නිමවුම් ප්‍රතිශතය		49%
ලාභය/අලාභ 2012 දෙසැ. 31 දක්වා	(200)	3,186.27

සටහන :

නිමවුම් ප්‍රතිශතය ගණනය කිරීම සඳහා මින් එක ක්‍රමයක් භාවිතා කළහැකිය. කෙසේවුවත් විකුණුම් වටිනාකම් ක්‍රමය පදනම් කරගෙන කොන්ත්‍රාත් ගිණුම සකසා ඇත. පිරිවැය ක්‍රමය පදනම් කරගන්නේ නම් ලාභයට සහ අදාල ආදායමට ගැලපීම් කිරීම අවශ්‍යවේ.

(ලකුණු 12)

NOT FOR SALE

(ආ) * කොන්ත්‍රාත් පිරිවැයකරණය සඳහා වැඩිකලක් ගතවන අතර නිමකිරීම සඳහා ගතවන කාලය කෙටිය.

* කොන්ත්‍රාත් පිරිවැයකරණය විශාල පිරිවැය ඒකක සඳහා ද කාර්යය පිරිවැයකරණය අඩු පිරිවැය ඒකක සඳහා යොදා ගනී.

* කොන්ත්‍රාත් පිරිවැයකරණ නිමැවුම් කාලය වැඩි නිසා කොන්ත්‍රාත්තුවේ ලාභය හෝ පාඩුව හඳුනාගැනීමට නිමැවුම් ප්‍රතිශතය ගණනය කළයුතුය.කාර්යය පිරිවැයකරණයේදී ලාභය/පාඩුව හඳුනාගැනීම කාර්යය අවසානයේදී කළහැකිය.

(ලකුණු 03)

(මුළු ලකුණු 15)

<u>පිළිතුරු අංක 05</u>

(අ) මිලියන

	වර්ෂ 00	වර්ෂ 01	වර්ෂ 02	වර්ෂ 03	වර්ෂ 04	වර්ෂ 05
යන්ත්‍ර	(450.00)	-	-	-	-	25.00
පිරිවැය ඉතිරිය (W1)	-	70.00	77.18	88.20	91.88	95.55
අතුරු නිෂ්පාදන විකිණීම (W2)	-	64.00	67.20	76.80	80.00	83.20
කොන්ත්‍රාත් ශ්‍රමය	-	(0.80)	(0.80)	(0.80)	(0.80)	(0.80)
තාක්ෂණික නිලධාරි	-	(0.60)	(0.60)	(0.60)	(0.60)	(0.60)
රථ ගාල	-	(2.00)	(2.00)	(2.00)	(2.00)	(2.00)
අනෙකුත් වියදම්	-	(5.00)	(7.00)	(9.00)	(10.00)	(12.00)
ශුද්ධ මුදල් ප්‍රවාහය	(450.00)	125.60	133.98	152.60	158.48	188.35
වට්ටම් සාධකය 15%	1.00	0.870	0.756	0.658	0.572	0.497
වට්ටම් කල මුදල් ප්‍රවාහය	(450.00)	109.27	101.29	100.41	90.65	93.61
ශුද්ධ වර්තමාන වටිනාකම	**45.23**					

W1 - <u>පිරිවැය ඉතිරිය</u>

	වර්ෂ 00	වර්ෂ 01	වර්ෂ 02	වර්ෂ 03	වර්ෂ 04	වර්ෂ 05
අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන්	-	20,000.00	21,000.00	24,000.00	25,000.00	26,000.00
අපහරණ පිරිවැය මෙට්‍රික් ටොන් 1 ක	-	3,500.00	3,675.00	3,675.00	3,675.00	3,675.00
මුළු පිරිවැය ඉතිරිය (රුපි.) මිලියන	-	70.00	77.18	88.20	91.88	95.55

W2 - අතුරු නිෂ්පාදන විකුණුම්

	වර්ෂ 00	වර්ෂ 01	වර්ෂ 02	වර්ෂ 03	වර්ෂ 04	වර්ෂ 05
අතුරු නිෂ්පාදන මෙට්‍රික් ටොන් ප්‍රමාණය 80%	-	16,000.00	16,800.00	19,200.00	20,000.00	20,800.00
මෙට්‍රික් ටොන් මිල	-	4,000.00	4,000.00	4,000.00	4,000.00	4,000.00
මුළු පිරිවැය ඉතිරිය මිලියන	-	64.00	67.20	76.80	80.00	83.20

NOT FOR SALE

සටහන් :

* ශක්‍යතා අධ්‍යයනය සඳහා පිරිවැය ගිළුණු පිරිවැයකි.
* තාක්ෂණික නිලධාරි වේතන රු. 520,000 ව්‍යාපෘතිය නිසා වෙනස් නොවන බැවින් අදාල පිරිවැයක් නොවේ.
* රථ ගාල කුලිය ව්‍යාපෘතිය නිසා වෙනස් නොවන බැවින් අදාල පිරිවැයක් නොවේ.

(ආ) IRR ගණනය කිරීම

	වර්ෂ 0	වර්ෂ 1	වර්ෂ 2	වර්ෂ 3	වර්ෂ 4	වර්ෂ 5
ශුද්ධ මුදල් ප්‍රවාහය	(450.00)	125.60	133.98	152.60	158.48	188.35
20 % වට්ටම් සාධකය	1.000	0.833	0.694	0.579	0.482	0.402
වට්ටම් කල මුදල් ප්‍රවාහය	(450.00)	104.62	92.98	88.36	76.38	75.72
NPV	**(11.94)**					

NPV	DR
45.23	15%
(11.94)	20%
57.17	5%

IRR = 15% + (5% / 57.17) * 45.23 = 19.0%

IRR අර්ථය : ඉහත ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහය 19% වට්ටම් අනුපාතයෙන් වට්ටම් කලවිට NPV ශුන්‍ය වේ. මේ අනුව ව්‍යාපෘතිය 15% ක්වූ සමාගමේ ප්‍රාග්ධන පිරිවැයට වඩා වැඩි ඉපයීමක් ලබාදෙන බැවින් එය යෝග්‍යය.

(ලකුණු 02)

(ඇ) * IRR ක්‍රමයට එකිනෙකට සම්බන්ධ නොවූ ව්‍යාපෘති, නිසි පරිදි ප්‍රමුඛතාවය අනුව වර්ගීකරණය කිරීමක් කළ නොහැක.

* ව්‍යාපෘති කිහිපයක් අතුරින් එක ව්‍යාපෘතියක් පමණක් තෝරාගැනීමේදී IRR ක්‍රමය අනුව ප්‍රතිශත ඵලදාව ගණනය කිරීම නොමග යවන සුලුය.

* IRR ක්‍රමයේදී, මුදල් ප්‍රවාහ IRR ප්‍රතිශතයට නැවත ආයෝජනය කිරීමක් කෙරේයයි සාවද්‍ය උපකල්පනයක් කෙරේ.

* සම්ප්‍රදායික නොවන මුදල් ප්‍රවාහ වලදී වෙනස් IRR වලට අගයන ගණනාවක් ගත හැක.

(ලකුණු 02)

පිළිතුරු අංක 06

(අ) නිෂ්පාදනය (ඒකක)

	2013 අප්‍රේල්-ජූනි	2013 ජූලි-සැප්.	2013 ඔක්.-දෙසැ.	2014 ජන. - මාර්තු
A භාණ්ඩය				
විකුණුම්	84,000	88,200	93,000	96,000
එකතුව : අවසාන තොග	14,700	15,500	16,000	16,800
අඩුකලා : ආරම්භ තොග	(14,000)	(14,700)	(15,500)	(16,000)
නිෂ්පාදන	**84,700**	**89,000**	**93,500**	**96,800**
B භාණ්ඩය				
විකුණුම්	63,000	66,000	67,800	69,000
එකතුව : අවසාන තොග	11,000	11,300	11,500	12,000
අඩුකලා : ආරම්භ තොග	(10,500)	(11,000)	(11,300)	(11,500)
නිෂ්පාදනය	**63,500**	**66,300**	**68,000**	**69,500**

(ලකුණු 06)

(ආ) **X අමුද්‍රව්‍ය ගැණුම් අයවැය (කි.ග්‍රෑ)**

	අප්‍රේල්	මැයි	ජූනි
A භාණ්ඩය			
විකුණුම්	28,000	28,000	28,000
එකතුව : අවසාන තොග	14,000	14,000	14,700
අඩුකලා : ආරම්භ තොග	(14,000)	(14,000)	(14,000)
නිෂ්පාදනය	28,000	28,000	28,700
B භාණ්ඩය			
විකුණුම්	21,000	21,000	21,000
එකතුව : අවසාන තොග	10,500	10,500	11,000
අඩුකලා : ආරම්භ තොග	(10,500)	(10,500)	(10,500)
නිෂ්පාදනය	21,000	21,000	21,500

NOT FOR SALE

X අමුද්‍රව්‍ය ගැණුම් අයවැය වටිනාකම.

	අප්‍රේල්	මැයි	ජූනි	එකතුව
A භාණ්ඩය	77,000	77,000	78,925	
B භාණ්ඩය	80,850	80,850	82,775	
මුළු අවශ්‍යතාවය	157,850	157,850	161,700	
එකතු : අවසාන තොග	31,570	32,340	33,110	
අඩුකලා : ආරම්භ තොග	(31,570)	(31,570)	(32,340)	
අවශ්‍ය ගැණුම් (කි.ග්‍රෑ.)	**157,850**	**158,620**	**162,470**	**478,940**
ගැණුම් (රු.)	**31,570,000**	**31,724,000**	**32,494,000**	**95,788,000**

(ලකුණු 07)

(ඇ)

- Δ මෙහෙයුම් සැලසුම් කිරීමට.
- Δ ආයතනයේ විවිධ අංශවල කාර්යයන් සම්බන්ධීකරණය කිරීමට.
- Δ වගකිවයුතු කළමනාකරුවන් ඉදිරි සැලැසුම් ගැන දැනුවත් කිරීමට.
- Δ අභිප්‍රායන් සපුරාගැනීමට කළමනාකරුවන් අභිප්‍රේෂණය සඳහා යොදා ගැනීමට.
- Δ සත්‍ය සහ අයවැය උත්ත සංසන්ධනය කර අවශ්‍ය පාලන පියවරයන් ගැනීමට.
- Δ සේවකයන්ගේ ක්‍රියාකාර්ත්වය ඇගයීමට උපයෝගී කර ගැනීමට.

(ලකුණු 02)

(මුළු ලකුණු 15)

<u>පිළිතුරු අංක 07</u>

(අ) මූලික මූල්‍ය කළමණාකරන තීරණ අංග ;

(i) මෙය ආයතනයේ ආයෝජන සැලසුම් හා කළමනාකරණ ක්‍රියාවලියයි. මෙය දිගුකාලීන හෝ කෙටිකාලීන වියහැක.

උදා : කොපමණ මුදලක් කෙටිකාලීන ආයෝජන සඳහා යෙදවිය යුතුද ?

මුදල් කළමනාකරුවකු දිගුකාලීන ආයෝජන පිළිබදව කුමන ව්‍යාපාර කටයුතුවල ආයෝජනය කළයුතුදැයි සැලකිල්ලක් දක්වයි.

අවශ්‍ය වත්කම් මොනවාද, අනාගත මුදල් ප්‍රවාහයන්ගේ කාලය හා අවදානම කුමක්ද යන්න පිළිබදවද සැලකිල්ලක් දක්වයි.

මුදල් කළමනාකරුවෙකු කෙටිකාලීන ආයෝජන පිළිබදව තොග, ණයගැතියන්, කෙටිකාලීන වගකීම් වැනිදේ මත සිදුවන ආයෝජන ගැන සැලකිල්ලක් දක්වයි.

(ii) මුදල් ගලා එන්නේ කුමන මාර්ගයන්ගෙන්ද (ප්‍රාග්ධන ව්‍යුහය / මූල්‍යකරණ තීරණ)
මෙය ආයතනයන්ගේ ක්‍රියාකාර්ත්වය මූල්‍යකරණය සඳහා යොදාගන්නා නිශ්චිත දිගුකාලීන ණය හා ස්කන්ධ වල සම්මිශ්‍රණයකි. විශේෂයෙන් දිගුකාලීන ආයෝජනයන්ය. මෙම මිශ්‍රනය

ආයතනයේ අවදානමට හා අගය යන දෙකටම බලපායි. මුදල් කළමණාකරුවෙක් හොඳම මූල්‍ය සංයුතිය සහ මුදල් උපයාගන්නා ආකාරයන් ගැන සැලකිල්ලක් දක්වයි.
ඒ අතරතුර මුදල් කළමණාකාරවරයෙක් ආයතනයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය හා වියදම් සහිත බාධාවක් මගහරවා ගැනීමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් ඇති බවට තහවුරු කරගැනීමට අවශ්‍ය වේ. කෙටිකාලීන ණය අවශ්‍යවූ විට කාරක ප්‍රාග්ධන ඌනතා මූල්‍යකරණය සඳහා ඒවා ලබාගන්නේ කෙසේද යන්න ඔහු තීරණය කරයි.

(iii) ලාභාංශ තීරණය.

ව්‍යාපාරය ලාභ ලබන තත්වයට පත්වූ විට, එම ලාභය හිමිකරුවන් අතර බෙදාදෙන්නේ කෙසේද යන්න තීරණය කිරීම අවශ්‍යවේ. මුදල් කළමනාකාරවරයෙක් ව්‍යාපාරයේ අනාගත උන්නතිය සඳහා කොපමණ ලාභ ප්‍රමාණයක් රඳවාගතයුතුද යන්න හා කොපමණ ලාභ ප්‍රමාණයක් බෙදාහැරිය යුතුද යන්න තීරණය කිරීම අවශ්‍යවේ.

(ලකුණු 05)

(ආ) මුදල් කළමනාකරණයේ අරමුණවන්නේ කොටස් හිමියන් සඳහා අගයක් එකතුකිරීම හා හිමිකරුවන්ගේ ස්කන්ධය උපරිම කිරීමය. එනම් ප්‍රවර්තන කොටස් අගය උපරිම කිරීමයි.

(ලකුණු 01)

(ඇ)(i) ලාභ පදනම් කරගෙන සකන්ධ ප්‍රාග්ධන පිරිවැය ගණනය කරනවිට එය කොටස් නිකුත් කිරීමේ මිල පමණක් පදනම් කරගෙන ගණනය නොකරයි. ආයෝජකයින් ලාභාංශවල වර්ධනයක් අපේක්ෂාකරන බැවින් එය කොටස්වල වෙළඳ මිල සහ වර්ධනය පදනම් කරගනී. මේ අනුව හොඳම ක්‍රමය වනුයේ ලාභාංශ ප්‍රවර්ධන ආකෘතියයි. එනම්

ස්කන්ධ ප්‍රාග්ධන පිරිවැය $= D_0 (1+g)/MV + g$
$= 5(1.05)/50 + 5\%$
$= 15.5\%$

ඒ අනුව ස්කන්ධ ප්‍රාග්ධනය පිරිවැය 12.5% නොව 15.5%

(ii) ණය පොලිය, බදුකරණයේදී වියදමක් ලෙස අඩුකළ හැකි නිසා ණය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීමේදී මෙම බදු වාසිය සැලකිල්ලට ගතයුතුය.

ණය පිරිවැය $= I \times (1-t) / D$
$= \frac{10 \times (1 - 28\%)}{80} = 9.0\%$

ඒ අනුව ණය ප්‍රාග්ධන පිරිවැය 12.5% නොව 9.0% වේ.

NOT FOR SALE

(iii) ණය ප්‍රාග්ධන අනුපාතය පොත් අගයන් මත හෝ වෙළඳපොල වටිනාකම මත පදනම් කල හැක. වෙළඳපොල වටිනාකම මත ගණනය කිරීම භරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය සඳහා යොදයි. පොත් අගය මත පදනම් කලවිට, ස්කන්ධ ප්‍රාග්ධනයට ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත ඇතුලත් වේ. ඒ අනුව ස්කන්ධ ප්‍රාග්ධනය මි. 80 + මි. 20 = මිලියන 100 ණය ප්‍රාග්ධනය මිලියන 80 ක් නිසා පොත් අගය මත ණය ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතය 80 :100 හෝ 1 : 1.25.

වෙළඳපොල වටිනාකම අනුව ගණනය කලවිට, ස්කන්ධ ප්‍රාග්ධන වෙළඳපොල වටිනාකම (කොටස් 2,000,000 x රු. 50 =) රු. මිලියන 100 වේ. ණය ප්‍රාග්ධන වෙළඳපොල වටිනාකම රු. මිලියන 80 කි. එය පොත් අගයද වේ. වෙළඳපොල වටිනාකම අනුව ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතය 80 :100 හෝ 1 : 1.25

මේ අනුව ප්‍රධාන විධායක නිලධාරිගේ ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතයට මෙම දෙකෙන් කුමන භරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීම පදනම්කර ගත්තත් එකඟවිය නොහැක.

WACC = (100x15.5% + 80x 9%) / (100+80) = 12.61%

(ලකුණු 09)

(මුළු ලකුණු 15)

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

නිවේදනය

මෙහි ලබාදුන් පිළතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම˜" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු˜" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් පධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.